**කුරුණෑගල මහා නගර සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 11 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ජූලි 31 දින ද සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාහන මිලදී ගැනීම් රු.5,263,360 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.6,361,482 ක් ලෙස දක්වා තිබුණි. | වාහන මිලදී ගැනීම් නිවැරදිව ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන වල අගය රු.6,361,482 ලෙස දක්වා ඇති ස්ථාවර වත්කම් වටිනාකම ස්ථාවර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් වී නොමැති ට්‍රැක්ටර් ට්‍රේලර් 04 ක වටිනාකම් වෙන් වශයෙන් වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට උපදෙස් ලබා දුන් බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතුව පැවති අත් කරත්ත 32 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දින වන විට මිල දී ගැනීමට ගිවිසුම්ගත වී නොතිබුණු රු.3,175,236 ක් වූ වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ණය හිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | මිලදී ගැනීමට ගිවිසුම්ගතව නොමැති භාණ්ඩ හා සේවා වෙනුවෙන් ණය හිමි ප්‍රතිපාදන සැලසීමට කටයුතු නොකළ යුතු වේ. | අදාළ ද්‍රව්‍ය මේ දක්වා නගර සභාව වෙත ලැබී නොමැති අතර අදාළ වෙන් කිරීම් කපා හැරීම සඳහා කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2019 ජනවාරි මාසයේ දී ජල ගිණුමෙන් සහ බස් නැවතුම්පල ගිණුමෙන් පිළිවෙලින් රු.5,664,044 ක් සහ 175,826 ක් ගෙවීම් කර තිබුණද, එම වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ ණය හිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. | ණය හිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් නොකිරීමෙන් වූ වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සභික දීමනා රු.1,305,000 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.870,000 ක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | සභික දීමනා මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වීමේ වරද නිවැරදි කරමි. |
| (ඊ) | ජල ආදායම් බිල් කිරීම් රු.94,716,039 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.93,748,287 ක් ලෙස දක්වා තිබුණි. | මාසිකව නිකුත් කරනු ලබන ජල බිල්පතේ ගාස්තු එකතුව වාර්ෂික බිල්කිරීම වේ. ඒ අනුව ආදායම් හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | ජලබිල් කිරීම්වල විවිධ හේතුන් නිසා වෙනස්කම් ඇතිවිය හැකිබව දන්වා සිටිමි. |
| (උ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති බොබ්කැට් යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු වත්කම් වටිනාකම තහවුරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ වටිනාකම් 2019 වර්ෂය තුළදී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ජල ආදායම් රු.38,523,337 ක් වූ නමුත් ආදායම් අංශයෙන් ලබාදුන් තොරතුරු අනුව රු.34,905,271 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | නාගරික ගණකාධිකාරි ආදායම්/ නාගරික ඉංජිනේරු සමඟ සාකච්ඡා කර අපේක්ෂිත පිළිතුර එවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (එ) | ආදායම් අංශයෙන් ලබාදුන් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ දී රැස්කළ ජල ආදායම් රු.97,775,425 ක් වූ නමුත් සාරාංශ ආදායම් ලේඛනය අනුව එය රු. 93,193,107 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | නාගරික ගණකාධිකාරි ආදායම්/ නාගරික ඉංජිනේරු සමඟ සාකච්ඡා කර අපේක්ෂිත පිළිතුර එවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | වාහන ලේඛනයට අනුව මෝටර් රථ හා කරත්ත වල වටිනාකම රු. 234,748,938 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම රු.173,135,254 ක් විය. | වාහන නිවැරදිව ලේඛනගත කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහන ප්‍රත්‍යාගණනය කර ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඔ) | තැන්පත් ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ටෙන්ඩර් තැන්පත්, ආදායම් වෙනුවෙන් තැන්පත් සහ විවිධ තැන්පත් ශේෂයන් පිළිවෙලින් රු.1,814,760 ක් රු.20,783,827 ක් හා රු.12,099,828 ක් වු අතර, මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂයන් පිළිවෙලින් රු. 3,628,865 ක්, රු.28,747,579 ක් සහ රු. 5,455,283 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන්, ලේඛන අනුව ශේෂයන් සමඟ සසඳා ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ටෙන්ඩර් ඇප තැන්පත්, ආදායම් වෙනුවෙන් තැන්පත් හා විවිධ තැන්පත් සඳහා 2018.12.31 දිනට ලේඛනවල නිවැරදි ශේෂයන් අනුව මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 6 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල පැවති ශේෂයන් අතර රු. 102,598,561 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛන අනුව මිශ්‍ර තැන්පත් මුදල රු. 11,114,800 ක් වුවද, අදාළ ලේඛනය අනුව එම මුදල රු. 7,244,316 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ග) | අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 317,551,164 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන ලේඛන, උපලේඛන හා අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ස්ථාවර තැන්පත් උපලේඛන, සේවක ණය උපලේඛන වලට අමතරව අනෙකුත් සියලු ලේඛන සකස් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුනිමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| මහා නගර සහා ආඥා පනතේ 247 (අ), (ආ), (ඇ) වගන්ති | සහා බල ප්‍රදේශයේ පැවති බදු අයකර ගත යුතු ආයතන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් පවත්වා, ලේඛන ගත කර අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහා නගර සහා ආඥා පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාර්ෂිකව සමීක්ෂණ පවත්වා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස නාගරික ගණකාධිකාරි, ආදායම් පරීක්ෂකවරු සහ විෂයභාර නිලධාරීන් දැනුවත් කරන බව දන්වා සිටිමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 281,518,678 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 212,024,949 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. වරිපනම් හා බදු | 174,446 | 176,342 | 179,193 | 82,495 | 160,900 | 167,197 | 162,305 | 85,347 |
| II. බදු කුලී | 76,456 | 70,803 | 74,723 | 12,220 | 80,630 | 71,123 | 67,977 | 16,139 |
| III. බලපත්‍ර ගාස්තු | 16,152 | 20,107 | 20,107 | - | 14,705 | 15,914 | 15,914 | - |
| IV. වෙනත් ආදායම් | 409,862 | 476,761 | 472,077 | 104,224 | 413,147 | 336,470 | 268,771 | 99,540 |
| එකතුව | 676,916 | 744,013 | 746,100 | 198,939 | 669,382 | 590,704 | 514,967 | 201,026 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් කොට්ඨාස 12 කට අදාළව සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු.74,489,507 ක් වූ අතර, දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු. 42,872,002 ක් විය. එය වාර්ෂික බිල් කිරීමෙන් සියයට 57 ක් වූ අතර, ඒ තුළ රජයේ දේපල 25 කට අදාළව අයවිය යුතු රු. 3,737,010 ක ශේෂයක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ මුදලින් වසරකට වඩා වැඩි ශේෂය රු. 26,936,893 ක් විය. | නියමිත කාලය තුළ බදු මුදල් අයකර ගැනීමටත්, පනතේ විධි විධාන ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නැවත දේපල තහනම් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර, රජයේ දේපල සඳහා වූ හිඟ මුදල් ගෙවීමට සිහි කැඳවීම් ලිපි යවා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ආදායම් රු.38,523,337 ක් වූ අතර එයින් රු. 100,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 22 කට අදාළව රු.9,266,762 ක ශේෂයක් පැවතුණි. | නියමිත කාලය තුළ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ලොතරැයි කුටි කුලී හා සංචාරක කුලී ආදායම් එකතුව රු. 2,647,128 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ලොතරැයි කුටි කුලී මුදලින් රු. 296,259.13 ක් 2019.06.10 දිනට අයකර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වැහැර නව සාප්පු සංකීර්ණයෙහි කඩ කාමර 05 කට අදාළව රු. 50,000 ක කඩ කුලී ශේෂයක්ද, කුරුණෑගල නව සාප්පු සංකීර්ණයෙහි කඩ කාමර 45 කට අදාළව රු.482,500 ක කඩ කුලී හා කඩ කාමර 49 කට අදාළව රු. 260,010 ක සේවා ගාස්තු හිඟයක් පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල සහ හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කුලී අය නොවූ කඩ සඳහා නඩු පැවරීමට නීති නිලධාරී වෙත භාර දී ඇත. |
| (ඇ) | කුරුණෑගල බස් නැවතුම්පොළ කඩ කාමර 49 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු කඩ කුලිය රු.509,968 ක් වූ අතර, හිඟව පැවති පෙර ගෙවුම් මුදල් රු.41,400 ක් විය. | නියමිත කාලය තුළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට රජපිහිල්ල හා රන්තලිය තානායම් දෙකෙන් රු. 6,367,256 ක කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රජපිහිල්ල තානායම සඳහා 26RE නඩුව පවරා ඇති අතර රන්තලිය තානායම සඳහා අය විය යුතු මුදල ගෙවන ලෙස ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් වෙත ලිපි මගින් දැනුම් දී ඇත. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා බල ප්‍රදේශය තුළ බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ආයතන සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයන් සිදුකර ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර සභා | වාර්ෂික සමීක්ෂණය නිවැරදිව සිදුකර, ලේඛනගත කර බදු අය කිරීම් අනුව ලේඛන | 2016 වර්ෂයේ සිට වෙළඳ බලපත්‍ර අයකිරීම් සම්බන්ධ සියළුම කටයුතු පරිගණක මෘදුකාංග ගත කොට ඇති බැවින් ලිඛිත ලේඛණයක් පවත්වාගෙන යනු |

| | | |
|---|---|---|
| බල ප්‍රදේශයේ බලපත්‍ර ලබාගත යුතු හා බලපත්‍ර ලබාගත් ව්‍යාපාර ආයතන පිළිබඳ නිවැරදි තොරතුරු ආදායම් අංශය සතුව නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. තොරතුරු අනාවරණය කරගත හැකි පරිදි පවතින පරිගණක මෘදුකාංගය සකස් කළ යුතු වේ. | නොලබයි. නව ව්‍යාපාරයන් ලියාපදිංචි කිරීමේදී ආදායම් පරීක්ෂක විසින් දෙනු ලබන වාර්ථාව අනුව අත්‍යාවශ්‍ය තොරතුරු බලපත්‍රයේ සඳහන් වේ. |

**2.2.5 වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වැසිකිලි ගාස්තු ප්‍රමාද මුදල් රු.110,000 ක්, සිම්පත් අලෙවි ස්ථාන, සංචාරක කුලී හා ලොතරැයි කුටි සඳහා ප්‍රමාද ගාස්තු රු. 273,430 ක් අයවිය යුතුව පැවතුණි. | අයවිය යුතු ගාස්තු ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සංචාරක කුලී හා ලොතරැයි කුටි ප්‍රමාද ගාස්තු හිඟ මුදල් වූ රු. 264,712 ක මුදලින් 2019.06.10 දිනට රු.29,626 ක මුදලක් අයකර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ශුනාගාර ගාස්තු රු.277,250 ක් සහ සිම්පත් අලෙවි ස්ථාන ගාස්තු රු.630,555 ක් අයවිය යුතුව පැවතුණි. | නියමිත කාලය තුළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ශේෂය රු.36,616,288 ක් විය. | ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබීමට නියමිත උසාවි දඩ සහ මුද්දර ගාස්තු නිරවුල් කර දෙන ලෙස අදාල අංශ දැනුවත් කර ඇත. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2018 වර්ෂය සඳහා (කර්මාන්ත සහ ඉදිකිරීම් ඇතුළත්) ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. |

**(ආ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු කර්මාන්ත 81 ක් රු. 41,023,254 ක වියදමක් දරා නිම කර තිබුණි. | අයවැය ප්‍රතිපාදන සැලසීමේ අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය අනුව කටයුතු කළ යුතුය. | සභාවේ සහ නාගරික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සැලකිල්ලට ගෙන මෙම සංශෝධනයන් සිදුවී ඇත. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාබනික පොහොර නිෂ්පාදනය සඳහා විශාල කසළ තොගයක් සභාව සතුව පැවතියද කසළ හැලීම සඳහා භාවිතා කරන හලර් යන්ත්‍ර දෙකම අක්‍රිය වීම හේතුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය සිදුව නොතිබුණි. | පොහොර නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීමටත් කටයුතු කළ යුතු වේ. | වර්තමානයේ දී එක් හලර් යන්ත්‍රයක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවත් අනෙක් යන්ත්‍රයට දැලක් සවිකිරීමට හා මෝටරය අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |
| (ii) 2010 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන රු. ලක්ෂ 80 කින් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භකර ප්ලාස්ටික් ද්‍රව්‍ය කැබලි වලට කැපීම සහ පොලිතින් උණු කිරීම සඳහා යන්ත්‍ර 02 ක් සවිකර තිබූ නමුත් අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05 කින් පමණ වසා දමා තිබූ බැවින් දරන ලද වියදම නිශ්කාර්යය වී තිබුණි. | අවශ්‍යතාවය අනුව අදාළ යන්ත්‍ර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ යන්ත්‍ර සඳහා ටෙන්ඩර් කැඳවා ඇති නමුත් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පළපුරුදු සහ පෙර අත්දැකීම් සහිත ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීය. එම යන්ත්‍ර ක්‍රියාත්මක තත්වයේ නොමැති අතර ඒ සඳහා මේ වන විටත් විශේෂ අවධානය යොමුකර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.57,914,422 ක් වැයකර තොග ජල ඒකක 2,762,658 ක් මිලදී ගෙන තිබුණද ජල ඒකක 618,234 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව ජල ඒකක 2,144,424 ක වෙනසක් පැවතුණි. | ජල තොග නිකුත් කිරීම් විධිමත් කර, බිල්කිරීම්වල පවතින වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. | නාගරික ගණකාධිකාරී/ නාගරික ඉංජිනේරු සමඟ සාකච්ඡා කර පිළිතුරක් එවන බව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| (i) | 2014 නොවැම්බර් 12 දිනැති 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෞඛ්‍ය කම්කරු, මුරකරු හා ක්ෂේත්‍ර කම්කරු යන තනතුරු සඳහා 109 දෙනෙකු ස්ථිර කර තිබිය දී එම චක්‍රලේඛයේ 7 වගන්තිය ප්‍රකාරව කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව අනියම්, දෛනික පදනම මත සේවකයින් 86 දෙනෙකු බඳවාගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ. | අත්‍යාවශ්‍ය සේවාවන් පුළුල් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින් බඳවාගන්නා ලෙස සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යෝජනා අනුව 2018 වසර තුළ දෛනික කුලී දීමනා පදනමින් ශ්‍රමිකයින් 86 දෙනෙකු බඳවා ගැනීමට සිදුවිය. |
| (ii) | 2014 මාර්තු 31 දිනැති අංක 03 / 2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2 වන වගන්තියට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොමැති තනතුරු 03 ක් සඳහා සේවකයන් 09 දෙනෙකු බඳවාගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ. | අත්‍යාවශ්‍ය සේවාවන් පුළුල් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින් බඳවාගන්නා ලෙස සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යෝජනා අනුව බඳවා ගැනීමට සිදුවිය. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට තනතුරු 04 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 50 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන්නේ නම් කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අත්‍යාවශ්‍ය සේවාවන් පුළුල් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින් බඳවාගන්නා ලෙස සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යෝජනා අනුව 2018 වසර තුළ දෛනික කුලී දීමනා පදනමින් ශ්‍රමිකයින් 86 දෙනෙකු බඳවා ගැනීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් පරීක්ෂක තනතුරේ අතිරික්තතා 06ක් පැවතුණි. | අනුමත කාර්යය මණ්ඩලයට යටත්ව බඳවා ගැනීම්/ අනුයුක්ත කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | අත්‍යාවශ්‍ය සේවාවන් පුළුල් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින් බඳවාගන්නා ලෙස සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යෝජනා අනුව 2018 වසර තුළ දෛනික කුලී දීමනා පදනමින් ශ්‍රමිකයින් 86 දෙනෙකු බඳවා ගැනීමට සිදුවිය. |
| (v) | 2018 වර්ෂය තුල ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවාගත් සේවකයින් 39 දෙනෙකුට 2018 වර්ෂය තුළ රු. 5,169,954 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | අත්‍යාවශ්‍ය සේවාවන් පුළුල් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින් බඳවාගන්නා ලෙස සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යෝජනා අනුව 2018 වසර තුළ දෛනික කුලී දීමනා පදනමින් ශ්‍රමිකයින් 86 දෙනෙකු බඳවා ගැනීමට සිදුවිය. |
| (ආ) | **සේවක ණය**<br>-------------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ආයතනයකට ස්ථාන මාරු වී ගිය , විශ්‍රාම ගිය, මිය ගිය, සේවය අතහැර ගිය සහ වැඩ තහනම් වූ නිලධාරීන් 11 ක ගෙන් රු. 623,863 ක ණය ශේෂ හා පෞද්ගලික තොරතුරු සොයා ගැනීමට නොහැකි වීම මත නිලධාරීන් 5 ක ගෙන් රු. 167,751 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | **සේවක ඇප**<br>-------------- | | |
| | නිලධාරීන් 31 කගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීති, රීති රෙගුලාසි අනුව අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මු.රෙ.881 ප්‍රකාරව ඇප තැන්පත් තැබිය යුතු තනතුරු දරණ සියළුම නිලධාරින්ගේ ඇප මුදල් තැබීම සඳහා කටයුතු කරන ලෙස නාගරික ලේකම්/ නාගරික |

| | | |
|---|---|---|
| | | ගණකාධිකාරි දැනුවත් කරන ලද බව දන්වා සිටිමි. |

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේදී වැඩසටහන් අයවැය ලේඛනයට සමගාමීව ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කරන ලෙස නාගරික දෙපාර්තමේන්තු ප්‍රධානීන්ව දැනුවත් කරමි. |

**3.4.2 සැපයීම් හා සේවා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල මහජන පුස්තකාලයට කැමරා පද්ධතියක් සවිකිරීමේදී cctv කැමරා සවිකිරීම සඳහා 2018 වර්ෂයට ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට කටයුතු නොකර කුරුණෑගල ප්‍රදේශයේ තෝරාගත් ආයතන 03 කින් පමණක් විනිවිදභාවයකින් තොරව මිල ගණන් ලබාගෙන තිබුණි. කැමරා 44 කට අදාළව කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් හා නියෝජිත ආයතනයේ මිල ගණන් අතර 88,400 ක වෙනසක් පැවතුණි. | තරඟකාරී මිලගණන් මත මිලදී ගැනීම් සිදුකර සභාවට වාසිදායක වන පරිදි කටයුතු කළ යුතු වේ. | නාගරික ගණකාධිකාරි හා නාගරික ඉංජිනේරු සමඟ සාකච්ඡා කර පිළිතුරක් ඉදිරියේදී එවීමට කටයුතු කරමි. |
| (ආ) | පුස්තකාලයේ සවිකර ඇති CCTV කැමරා පද්ධතියේ රු. 140,000 ක් ගෙවා සවිකර තිබූ 32 "LED TV හතරෙන් එකකට පමණක් වගකීම් සහතිකයක් ලබා දී තිබුණි. එහි මිලදී ගත් දිනය 2018 සැප්තැම්බර් 26 දින ලෙස සඳහන්ව තිබූ නමුත් අදාළ ගිවිසුම 2018 ඔක්තෝබර් 10 දින අත්සන් කර තිබුණි. ඒ අනුව අදාළ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට පෙර අදාළ කාර්යය සිදු කර තිබුණි. තවද, සවිකර තිබූ කැමරා 48 සඳහා අවුරුදු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නාගරික ගණකාධිකාරි හා නාගරික ඉංජිනේරු සමඟ සාකච්ඡා කර පිළිතුරක් ඉදිරියේදී එවීමට කටයුතු කරමි. |

02 ක වගකීම් කාලයක් ලබා දෙන බව සඳහන් වුවද ඒ සඳහා වගකීම් සහතික ඉදිරිපත් කර නොතිබූ අතර CCTV කැමරා පද්ධතියේ මිල ගණන් කැඳවීමට අදාළ පිරිවිතරවල අනුකූල නොවන පරිදි TV හා වයරින් කේබල් යොදාගෙන තිබුණි.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ III කොටසේ 13 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතව නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර විගණන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ජනවාරි 01 දින සිට ස්වාධීන අඛණ්ඩ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර ඇති අතර අක්‍රීයව තිබූ විගණන හා කළමනාකරණ කමිටුවද ස්ථාපනය කර ඇත. |